**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය - 2020**
-----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනත සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කළ එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති පිරිවැය රු. 25,801,935 ක් වූ දේපළ පිරියත උපකරණ සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | දේපළ පිරියත හා උපකරණ තුළ ඇතුළත් මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර ගිණුම් තබා ඇති අතර, අනෙකුත් වත්කම් ඓතිහාසික පිරිවැය මත ගිණුම් තබා ඇත. සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම් අතුරින් භාවිතා කළ හැකි වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ලබන අතර, අනෙකුත් වත්කම් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | එලදායී ජීවිත කාලය සමාලෝචනයට භාජනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හඳුනා ගැනීම සහ ගොවි විශ්‍රාමිකයින් සඳහා වන මරණ පාරිතෝෂිකය ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට රු. 1,077,622,157 ක් වූ ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සම්බන්ධ බැරකම් ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කර කාලානුරූපීව ප්‍රතිපාදනයන් කර නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් වාර මුදල් ලබාගෙන මෙම අරමුදල ක්‍රියාත්මක කරගෙන යා යුතු වන අතර, වර්ෂය තුළ සිදුකරනු ලබන පාරිතෝෂික ගෙවීම් මෙම අරමුදලට හර කරනු ලබයි. ඉදිරියේදී නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භ වීමත් සමඟම වාර්ෂිකව ආයුගණක තක්සේරුව සිදුකිරීමට කටයුතු කරනු ඇත. | මරණ පාරිතෝෂික අරමුදල සම්බන්ධ බැරකම් ආයුගණක තක්සේරුව මඟින් කාලානුරූපීව ගණනය කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරයෙහි පවත්වාගෙන යනු ලබන නිල නිවාස 3 පිහිටි මණ්ඩලයට අයත් පර්චස් 76.6 ක් වූ ඉඩම් සහ ඇඹිලිපිටිය නිල නිවාසයේ ගොඩනැගිලි වටිනාකම, තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂකවරුන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| නොගෙවූ වන්දි | 76,174,434 | නොගෙවූ වන්දි ලේඛනයක් හෝ පරිගණක සටහනක් | එම චෙක්පත්වල විස්තර වෙන වෙනම පරිගණකයේ තබාගෙන යනු ලබන අතර, තොරතුරු අදාළ ගොනුවල ඇතුළත් කර ඇත. එම චෙක්පත් ආදායමට ගැනීමේදී පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි ගොනුගත කර ඇති අතර, නැවත වරක් එම චෙක්පත සඳහා හිමිකම්පාන අවස්ථාවකදී අදාළ ගොනුවෙන් පරීක්ෂා කර බලා ගෙවීම් සිදුකරනු ලබයි. | නොගෙවූ වන්දි චෙක්පත් හඳුනාගැනීමට හැකි වන පරිදි ලේඛනයක් හෝ පරිගණක සටහනක් පවත්වාගෙන යා යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධ අමාත්‍යාංශයේ සේවය සඳහා මුදාහරින ලද නිලධාරියෙකුට මණ්ඩලයෙන් ගෙවන ලද වැටුප් රු. 228,015 ක් ප්‍රතිපූර්ණය කර නොගෙන වර්ෂ 9 ක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනඑමින් පවතී. | ගිණුම් වර්ෂය ආරම්භයේදී ලැබිය යුතු වැටුප් රු. 342,023 ක ශේෂයක් පැවති අතර 2021 වර්ෂය තුළදී රු. 57,004 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර ඉතිරිය අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ප්‍රතිපූර්ණය කර ගැනීමට පියවර ගත යුතු වීම. |
| (ආ) අවුරුදු 01 සිට අවුරුදු 25 ක් දක්වා පැරණි රු. 1,764,637 ක් වූ ණය හා අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලීනව අය නොවන සේවක ණය සහ අත්තිකාරම් පිළිබඳ විස්තර අධ්‍යක්ෂ (පාලන) වෙත ලබාදී ඇති අතර තවදුරටත් තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පසු මෙම ණය අයකර ගැනීමට කටයුතු සිදුකරනු ඇත. | ණය හා අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.426,871 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | මෙම ශේෂයේ සඳහන් ආපසු ගෙවන ටෙන්ඩර් මුදල් සඳහා අදාළ පාර්ශවයන් දැනුවත් කර එම මුදල් ඔවුන් විසින් නිසි පරිදි ඉල්ලුවිට ගෙවීමට 2021 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | මෙම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වන වර්ෂ 2018 - 2019 කාලපරිච්ඡේදයට අදාළව මුද්‍රණ වියදම්, මිශ්‍ර ණයහිමියන් සහ බෝග රක්ෂණ දිරිදීමනා ලෙස ගෙවිය යුතු එකතුව රු.999,713 ක් වූ ශේෂය නිරවුල් කර නොතිබුණි. | මෙම ශේෂයන් නිවැරදි ලෙස සැසඳුම්වලට ලක්කර නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1992 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>I. මු.රෙ.177(1) | එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතා හෝ හැකිතාක් කඩිනමින් බැංකුවට ප්‍රේෂණය කොට කුවිතාන්සි ලබා ගැනීම, රජය වෙනුවෙන් කවර මුදලක් වුවද එකතු කරන නිලධාරීන්ගේ රාජකාරිය වන අතර, ගාල්ල හා පුත්තලම දිස්ත්‍රික් කාර්යාලවල තැන්පත් කිරීමේ නියැදි පරීක්ෂාවට අනුව රක්ෂණ නිලධාරීන් විසින් රැස්කරන ලද කෘෂිකාර්මික රථ වාහන රක්ෂණ වාරික මුදල් මාස 1 ත් 2 ත් දක්වා ප්‍රමාද කර ප්‍රේෂණය කර ඇති බව නිරීක්ෂණය විය. | ක්ෂේත්‍රයේදී අයකරනු ලබන වාර මුදල් බැංකු ගත කිරීමේ ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය වූ නිසා එය මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන දැනුවත් කිරීම් සිදුකර ඇත. එසේ අයකරනු ලබන වාර මුදල් සැසඳීම් කටයුතු සිදුකරනු ලබන අතර ඉදිරියේදී එවැනි තත්ත්වයන් උද්ගත නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | රැස් කරනු ලබන මුදල් අප්‍රමාදීව බැංකු ගත කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| II.මු.රෙ. 261(3) | ප්‍රමාණවත් තරම් මුදල් ඇතොත් මිස කිසියම් ගෙවීමක් මුදල් පොතෙහි සටහන් කිරීම හෝ ගෙවීම් සඳහා චෙක්පතක් නිකුත් කිරීම හෝ නොකළ යුතුය. එමෙන්ම පවත්නා ගෙවීම් මෙන්ම ආසන්න ගෙවීම් ද ඇනහිටීමකින් තොරව කරගෙන යාමට හැකිවනු පිණිස නියමිත බලධාරීන් වෙත නිසි පරිදි කල්තබා ඉල්ලුම් කොට ප්‍රමාණවත් තරම් මුදල් ලබා ගැනීමට වගබලා ගත යුතු වුවත්, එසේ කටයුතු නොකිරීම මත රක්ෂණ වන්දි වෙනුවෙන් ලියන ලද මුළු වටිනාකම රු.55,720,568 ක් වූ චෙක්පත් 1,780 ක් නැවත ආදායමට ගෙන තිබුණි. | මණ්ඩලය විසින් ප්‍රමාණවත් මුදලක් ගිණුම්තුළ නොමැති නම් චෙක්පත් ලිවීම හෝ මුදල් පොත් සඳහා වවුචර්පත් ලිවීමක් සිදු නොකරයි. අවශ්‍යතාවය පරිදි වන්දි ගෙවීමේදී මුදල් ගෙන්වා ගැනීමට පෙර වන්දි ගෙවා පසුව මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කර ගන්නා අවස්ථා ඇත. ඒ අනුව සේනා දළඹු හානිය සඳහා සියයට 100 ක හානියට වඩා අඩුවෙන් හානිවූ අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා වන්දි ගෙවීමට අදාළව මෙම චෙක්පත් මණ්ඩලයේ පැවති අරමුදල් යොදාගෙන සකස් කළ අතර, අමාත්‍යාංශය විසින් මුදල් ලබාදීම ප්‍රමාද කළ නිසා එම චෙක්පත් ගොවීන් වෙත නිකුත් නොකර රඳවා ගන්නා ලදී. නමුත් සේනා දළඹු හානියේ සියයට 100 වගා හානි වූ ගොවීන්ට ගෙවීම සඳහා පමණක් රජය විසින් මුදල් ලබාදෙනු ලැබූ අතර, අර්ධ වශයෙන් සිදුවූ හානි සඳහා මුදල් ලබා නොදුන් නිසා ඉහත රු.55,720,568 ක් වූ මුළු වටිනාකම ආදායමට ගැනීමට කටයුතු කර ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ අර්ධ හානි සඳහා චෙක්පත් ලිවීමට සිදුවූයේ එම දිස්ත්‍රික්කයේ සේනා දළඹු හානිය සඳහා සියයට 100 ක් වන්දි මුලින්ම ගෙවූ බැවින් හා වන්දි ලබාගැනීමට ගොවීන් ඒකරාශීවීම් සිදුකිරීමත් ගොවි සංවිධාන විසින් දිගින් දිගටම වන්දි ඉල්ලා අරගල කිරීමත් හේතුවෙනි. | චෙක්පත් ලිවීමට පෙර මුදල් පවතින බව තහවුරු කර ගත යුතු වීම. |
| III. මු.රෙ 762 | තොග ඇණවුම් මට්ටම හඳුනාගෙන එම තොග මට්ටම පවත්වාගෙන නොයාම නිසා 2020 වර්ෂයේදී අවස්ථා 13 ක දී ගබඩාවේ | කාඩ්පත් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළත්, වසංගත තත්ත්වය නිසා නිසි පරිදි කාඩ්පත් සපයා ගැනීමට | ගබඩා තොග පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන |

| | | | |
|---|---|---|---|
| | කෘෂිකාර්මික රථ වාහන රක්ෂණ කාඩ්පත් තොගය අවසන් වී තිබුණි. තවද හදිසි අවශ්‍යතාවය මත කාඩ්පත් 25,000 ක් මිලදී ගැනීමේදී ගුවන් ගාස්තු ලෙස රු.148,000 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබූ අතර මෙම මුදල, නිසි ගබඩා තොග පාලන ක්‍රමවේදයක් භාවිතා නොකිරීම නිසා මණ්ඩලයට දැරීමට සිදුවූ අමතර පිරිවැයක් බව නිරීක්ෂණය විය. | නොහැකි වූ අතර අවශ්‍යතාවය මත ඉක්මනින් කාඩ්පත් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. ලැබෙන තොග දිස්ත්‍රික් කාර්යාලවල අවශ්‍යතාවය පරිදි බෙදාහැරීම සිදුකර ඇති නිසා ගබඩාව තුළ කාඩ්පත් තොග අවසන් වී ඇති අවස්ථා පැවතිණ. මෙම අඩුපාඩු මිලදී ගත් දත්ත පද්ධතිය මඟින් කළමනාකරණය කර ඇත. | යායුතු වීම. |
| (ආ) අනුමත බඳවා ගැනීම් පරිපාටිය | (i) ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මඟින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බාහිර හෝ අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගත යුතු බව සඳහන් වුවද ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, පද්ධති පරිපාලන නිලධාරී, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර, රියදුරු සහ කාර්යාල සහායක යන තනතුරුවලට විශ්‍රාමික නිලධාරීන් 8 දෙනෙකු සේවා කාලය දීර්ඝ කිරීම මත, නිලධාරීන් 8 දෙනෙකු කොන්ත්‍රාත් හා පුහුණු පදනම මත හා නිලධාරීන් 40 දෙනෙකු අනියම් පදනම මත බඳවාගෙන තිබුණි. | අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තම කාර්යභාරයට අමතරව අධ්‍යක්ෂ (පාලන) තනතුරේ කාර්යය ද ඉටු කිරීම නිසා අධ්‍යක්ෂ (පාලන) තනතුර සඳහා ක්ෂණිකව නිලධාරියෙකු බඳවා ගැනීමේ අවශ්‍යතාවය තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර වසරක කාලයකට කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලදී. තුන්වන පාර්ශවීය රක්ෂණ කටයුතුවලදී පවරා ඇති නඩු සම්බන්ධව ප්‍රමාදයන් යටපත් කර එම නඩු සක්‍රීය කර ගැනීම සඳහා 2020 වර්ෂයට අනුමත සංවර්ධන නිලධාරී තනතුරු මට්ටමින් වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමට සංවර්ධන නිලධාරී (නීති) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගන්නා ලදී. වෛද්‍යවරුන් සමඟ සම්බන්ධීකරණය කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත වසරකට කොන්ත්‍රාත් පදනම මත සංවර්ධන නිලධාරී (පශු රක්ෂණ) ලෙස නිලධාරියෙකු බඳවාගෙන එම අංශයේ ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබාදීමට කටයුතු සලසන ලදී. සුදුස්සෙකු බඳවාගන්නා තෙක් සේවය කඩිනම් කිරීම සඳහා සහකාර අධ්‍යක්ෂ (තොරතුරු | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | තාක්‍ෂණ) තනතුර සඳහා මාස 06කට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලදී. මෙම තනතුර සඳහා දැනටමත් බඳවාගැනිමේ කටයුතු ආරම්භ කර ඇත. මණ්ඩලයේ පැවති ප්‍රතිපත්තිය අනුව, සභාපතිවරයා සඳහා කොන්ත්‍රාත් පදනමින් රියදුරෙකු බඳවා ගන්නා ලදී. | |
| | (ii) සෑම සේවා කාණ්ඩායමකටම අයත් නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවම වශයෙන් වර්ෂයට එක් වතාවක් හෝ අවශ්‍ය වන පරිදි පවත්වනු ලැබිය යුතු අතර පත්වීමේ දින සිට අවුරුදු 03 ක් ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. එසේ වුවත් 2017 ජනවාරි සිට මේ දක්වා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් 2016 – 2017 වර්ෂවල දී මණ්ඩලයේ සේවයට බැඳුණු සහකාර අධ්‍යක්ෂකවරු 12 දෙනෙකුට, සංවර්ධන නිලධාරීන් 11 දෙනෙකුට හා කළමනාකරණ සහකාරවරු 15 දෙනෙකුට නියමිත කාල වකවානුවල දී කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමට නොහැකි වී තිබුණි. | කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය 2020 වර්ෂයේ සිට ඉදිරියට සෑම දිස්ත්‍රික්කයක් පාසා පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කර තිබුණත් කොරෝනා වසංගත තත්ත්වය යටතේ මෙම විභාගය පැවැත්වීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේ මුල් මාස 04 තුළ විභාග පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබුණද කොරෝනා තත්ත්වය නිසා එයද අපොහොසත් විය. නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරනු ලැබේ. | බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත | | | |
| (i) 7(අ)වගන්තිය | කෘෂිකාර්මිකයන්ට ස්ථාවරත්වය ලබාදීමේ හා කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව, පාඩු වෙනුවෙන් ඔවුන්ට හානි පූර්ණය සැලසීම සඳහා කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය පිණිස පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිහිටුවා ක්‍රියාත්මක කළ යුතු වුවද මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය කෙතට අරුණ රක්ෂණ ක්‍රමයට අදාළ ගොවීන් 8,185 කට හිමි වර්ෂ | ගොවීන් විසින් හිමිකම් නොපෑ රු. 70,800,200 ක වන්දි මුදල් දිගින් දිගටම ගොවියන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා | ගොවීන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 4 ක් පැරණි රු. 70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් බැංකු මඟින් ආපසු එවා තිබූ අතර අදාළ ගොවීන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. | |
| (ii) 7(ඇ)වගන්තිය | කෘෂිකාර්මික සහ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන සහ ඖෂධ පැළෑටි, ධීවර සහ වන නිෂ්පාදිත ගබඩා කිරීම සහ කල් තබා ගැනීම සම්බන්ධයෙන් වූ රක්ෂණ ක්‍රමයක් කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කළ යුතු වුවද ගබඩා රක්ෂණය සඳහා සැලසුම් සකස් කර තිබූ නමුත් එය ක්‍රියාත්මක කර නොතිබුණි. | මණ්ඩලයෙහි ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මකව පවතින නමුත්, 2020 වර්ෂය තුළදී ගොවීන්ගෙන් ඉල්ලීම් ලැබී නොතිබුණි. ගබඩා රක්ෂණය සඳහා ගොවීන් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර ඇත. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,229,863,654 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 702,186,912 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 527,676,742 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රතිරක්ෂණ වාරිකය වූ රු. 576,361,848 ක මුදල සමාලෝචිත වර්ෂයේ සිට ගෙවීම් නොකිරීම හා වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද වාරික මුදල් 2019 වර්ෂයට සාපේක්ෂව රු. 210,120,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------

මහා පරිමාණ මෙන්ම සුළු පරිමාණ පශු කර්මාන්තකරුවන්ගේ අවදානම අවම කර සුරක්ෂිතතාවය තහවුරු කිරීම අරමුණු කොට ක්‍රියාත්මක පශු රක්ෂණ යෝජනා ක්‍රමයේ ආදායම සීඝ්‍රයෙන් අඩුවෙමින් පැවතුණි. ඒ අනුව 2017 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වන විට පශු රක්ෂණ ආදායම සියයට 57 කින් එනම් රු. 13,391,254 සිට රු. 5,780,196 දක්වා රු.7,611,058 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2008 ජුනි 04 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට, මණ්ඩලය විසින් රු.565,800 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබූ අතර අත්තිකාරම් ලබා දී වසර 13 ක් ගතවී තිබුණ ද සැලසුම් ප්‍රකාරව කටයුතු ඉටුකරගෙන නොතිබුණි. | මෙම ඉඩම මණ්ඩලයට ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා ලබාදී ඇති ඉඩමක් වන අතර, 2021 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු තුළ ඉදිරි වැඩ කටයුතු ඇතුළත් කර ඇත. ඉදිරියේදී කාර්යාලය ඉදිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිතය. | සැලසුම් ප්‍රකාරව ඉදිකිරීම් නිම කළ යුතු වීම. |
| (ආ) 2020 නොවැම්බර් 19 දින කළමනාකරණ සහකාරවරුන් බඳවාගැනීම සඳහා රු.237,654 ක පිරිවැයක් දරා පුවත්පත් 3 ක දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය ලෙස 2020 දෙසැම්බර් 31 සඳහන් කර තිබියදී එය සැලකිල්ලට නොගෙන අධ්‍යක්ෂ ජනරාල් විසින් මධ්‍යම පළාතෙන් 16 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඉන් 07 දෙනෙකු 2020 නොවැම්බර් 26 දින සේවයට බඳවාගෙන තිබුණි. මේ නිසා පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද රු.237,654 ක් වූ පිරිවැය අනාර්ථික පිරිවැයක් බව නිරීක්ෂණය විය. | කළමනාකරණ සහකාරවරුන් 2020 වර්ෂයට අනුමත වී තිබූ ප්‍රමාණය බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කරන ලද අතර ඒවා තෝරාගෙන සම්මුඛ පරීක්ෂණ පවත්වන තෙක් අනියම් පදනම මත නිලධාරීන් 07දෙනෙකු බඳවා ගන්නා ලදී. ඉදිරියේ දී කැඳවන ලද අයදුම්පත් සඳහා විධිමත් සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගැනීම සිදුකෙරෙනු ඇත. | පුවත්පත් දැන්වීම පරිදි බඳවා ගැනීම් සිදු කළ යුතු වීම |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනයේ අනුමත තනතුරු නාම 421 න් තනතුරු 15 ක පුරප්පාඩු 155 ක් පැවති අතර ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල හා ක්ෂෙත්‍ර රාජකාරි කටයුතු ඉටු කිරීමට මෙම පුරප්පාඩු බාධාවක්ව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2020 වර්ෂය වන විට ද ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන්ම බඳවා ගැනීමට කටයුතු සිදු කර නොමැති අතර, මෙම කාර්ය මණ්ඩලය අනුමත කළ 2011 වර්ෂයේ සිටම මීට සමාන ප්‍රමාණයක් අඩු වැඩි වශයෙන් බඳවා ගැනීම් සිදු කර නොමැත. ඊට හේතුව මණ්ඩලය මේ වන විට ස්වයං මූල්‍ය පදනම මත කටයුතු කරන බැවින් මුළු කාර්ය මණ්ඩලයම එකවර බඳවා ගැනීම් සිදු නොකර මූල්‍ය ස්ථාවරය මත විටින් විට බඳවා ගැනීම් වැඩිකරමින් පවතී. මේ වන විට මණ්ඩලය විසින් සේවක බඳවාගැනීම් සිදුකරමින් පවතී. | අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනයට භාජනය කිරීම හෝ පුරප්පාඩු පිරවීම සිදු කළ යුතු වීම. |
| (ආ) රක්ෂණ භාර අරමුදල සමඟ ඇතිකරගත් ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව 2019 යල කන්නයට එක් ගොවියෙකු | 2019 යල කන්නය සඳහා ප්‍රතිරක්ෂණය යටතේ ලැබිය යුතු රක්ෂණ වන්දි මුදල් ලබාදෙන ලෙස අවස්ථා ගණනකදී ඔවුන්ට ලිඛිතව මෙන්ම | කාලපරිච්ඡේදයට අදාළ වන්දි මුදල් රක්ෂණභාර |

| | | |
|---|---|---|
| සඳහා වාර්තාගත විය හැකි මුළු වන්දි වටිනාකමෙන් මුල් රු. 10,000 ගෙවීම සඳහා රක්ෂණ භාර අරමුදල වෙතින් තවදුරටත් ලබා ගතයුතු රු.මිලියන 312 ක හිඟ මුදල ලබා ගැනීම වෙනුවට, 2020 වර්ෂයේදී ගිවිසුම් අහෝසි කර රු. 148,380,848 ක් පමණක් ලබා ගැනීම නිසා මණ්ඩලයට රු. 163,619,152 ක අලාභයක් සිදුව තිබුණි. | වාචිකවද දැනුවත් කර ඇති අතර, මේ පිළිබඳව මහා භාණ්ඩාගාරය හා ජාතික රක්‍ෂණ භාර අරමුදල සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප්‍රතිරක්ෂණය ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබාදීමට හැකියාවක් නොමැති නිසා, මණ්ඩලය විසින් ප්‍රතිරක්ෂණය සඳහා ගෙවූ වාර මුදල නැවත ප්‍රතිපූර්ණය කර ඇත. 2019 වර්ෂයට අදාළව වන්දි මුදලින් මුල් රු. 10,000 ක මුදල ගෙවීමට අදාළ සියලු මුදල් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් මණ්ඩලය වෙත ගෙවා ඇත. ඒ අනුව, ප්‍රතිරක්ෂණ ආවරණය ක්‍රියාත්මක නොවූ නිසා රු. 163,619,152 ක ලැබිය යුතු ලෙස ගණන් බලා තිබූ මුදල මණ්ඩලය වෙත ලැබී නොමැත. | අරමුදලින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අයත් “ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල” සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන නොයාම හේතුවෙන්, ශේෂය රු. 1,077,622,157 ක් වූ ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදලින්, එම යෝජනා ක්‍රමයට ලබා දී ඇති ණය මුදල, එම යෝජනා ක්‍රමයෙන් දායකත්ව මුදල් ලෙස ලැබිය යුතු ප්‍රමාණය සහ අරමුදලින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ වටිනාකම හා ඊට අදාළ පොලිය ද ඇතුළත් එකතුව රු.915,938,172 ක් අඩු කළ පසු ඉතිරිවන රු.161,683,984 ක ශේෂය, එම අරමුදලට කිසිඳු ප්‍රතිලාභයක් නොගෙවා මණ්ඩලයේ වියදම් සඳහා සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා භාවිතා කර තිබූ බව නිරීක්ෂණය විය. | මණ්ඩලයේ සියලු අරමුදල් සඳහා වෙන වෙනම බැංකු ජංගම ගිණුම් පවත්වා නොගන්නා අතර, පවත්නා ශේෂයන් ආයෝජන මාර්ගවල ආයෝජනය කරනු ලබයි. මෙම අරමුදලේ පවතින මුදල් මෙම අරමුදල සඳහා පහසුවෙන් හඳුනාගත හැකි පරිදි වෙනම ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි අවසාන වගකීම රජය දරන නිසා මෙවන් රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නැවත සමාලෝචනයට භාජනය කළ යුතු වීම. |
| (ඇ) තොග ඇණවුම් ලේඛනයක් නඩත්තු නොකිරීම සහ ගබඩා තොග ලේඛනය, යාවත්කාලීන කිරීම කර නොතිබීම නිසා රක්ෂණ කාඩ්පත් නැවත ඇණවුම් කළ යුතු අවස්ථාව හඳුනා ගැනීමට අපහසු වී තිබුණි. | තොග පාලනය සඳහා දත්ත පද්ධතියක් මණ්ඩලය සතුව නොතිබූ අතර, මේ වන විට තොග සම්බන්ධයෙන් පරිගණක ගත දත්ත පද්ධතියක් මිලදී ගෙන ඇති අතර, ඒ තුළින් තොග ලේඛනයන් යාවත්කාලීන කරගෙන යනු ලබයි. | තොග ඇණවුම් ලේඛන පවත්වාගෙන යා යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඉ) සාමාන්‍ය රක්ෂණය යටතේ ගැනෙන සුව සෙත හා හදිසි අනතුරු රක්ෂණ කටයුතු සඳහා 2020 වර්ෂයේ භෞතික ප්‍රගතිය, සැලසුම් කළ ප්‍රමාණයට සාපේක්ෂව සියයට 11 ත් 37 ත් අතර විය. | හදිසි අනතුරු හා සුවසෙත රක්ෂණ ආවරණය ගොවීන් සඳහා ප්‍රවර්ධනය කළද, පැවති වසංගත කාලය තුළදී අපේක්ෂිත ඉලක්ක ලැබී නොමැත. මෙම තත්ත්වය හේතුවෙන් ඒ සඳහා ප්‍රවර්ධන කටයුතු සිදුකිරීමේ අපහසුවක් පැවති අතර, ඉදිරියේදී මෙම රක්ෂණ ක්‍රමයන්හි අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු සලසා ඇත. | ප්‍රගතිය සමාලෝචනය කරමින් අවශ්‍ය ප්‍රවර්ධනයන් කළ යුතු වීම. |
| (ඊ) දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වගා හානි වටිනාකම තීරණය කිරීමට කාලගුණික දත්ත ලබා ගැනීම මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යභාරය වන අතර සැලසුම් කරන ලද දිස්ත්‍රික්කවලට අදාළව 1980 සිට 2019 දක්වා කාලගුණික දත්ත ලබාගැනීම වෙනුවෙන් ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව(IFC) විසින් මේ වන විට රු. මිලියන 1.715 ක මුදලක් ලබාදී තිබුණි. දිස්ත්‍රික්ක කිහිපයකම මෙම දත්ත ලබාගෙන තිබුණ ද ,මේ වන විටත් දර්ශක පදනම් කරගත් වන්දි ගණනය කිරීම වවුනියා හම්බන්තොට හා ගම්පහ දිස්ත්‍රික්කයන්ට පමණක් සීමා වී තිබීම, සැලසුම් කළ ඉහත දිස්ත්‍රික්කවල වර්ෂාමාපක මගින් දත්ත ලබා ගැනීමේදී ඒ ආශ්‍රිත ඉතා කුඩා අරයන් පමණක් ආවරණය වීම, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ප්‍රමිතගතව වර්ෂාමාපක ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණ ද වවුනියා දිස්ත්‍රික්කයේ ස්ථාන 03 ක පමණක් ස්ථාපනය කර තිබීම යන කරුණු හේතුවෙන් ව්‍යාපෘති කටයුතු සාර්ථකව ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. | දැනට ගම්පහ, වවුනියාව හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් සඳහා මෙම නව රක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දී ඇති අතර ඉදිරි කන්නවලදී කුරුණෑගල, අනුරාධපුරය, අම්පාර හා කිලිනොච්චිය ඇතුළු අනෙකුත් දිස්ත්‍රික්කයන් සඳහාද හඳුන්වා දීමට සැලසුම් කර ඇත. එහිදී මෙම අතීත කාලගුණික දත්ත භාවිතයට ගනු ලැබේ. 2021 යල කන්නයේ සිට කුරුණෑගල, අනුරාධපුරය, අම්පාර හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්කයන් සඳහා ද නව රක්ෂණ ක්‍රමවේද පර්යේෂණ මට්ටමින් සකස් කර පවතින ක්‍රමවේදය යටතේ වන්දි ගණනය කිරීම් සමග සංසන්දනය කර තවදුරටත් සුසර කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙහි සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී වගාහානි අයදුම්පත්‍ර 35 ක වගාකළ දිනය, අයදුම්පත් දිනය සහ වගා හානි දිනය කපා වෙනස්කිරීමට ලක්කිරීම, වගාවට හානි සිදුවූ බවට නිශ්චය කරගත් දිනය සම්පූර්ණ කර නොතිබීම, වගා කළ දින සිට දින 07 ක් ඇතුළත සිදුවන හානි වෙනුවෙන් අයදුම්පත් | 2019/2020 මහ කන්නය වන විට 2019 යල කන්නයේදී ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ලබා දුන් අයදුම්පත්‍ර ඉතිරිව තිබුණි. 2019/2020 මහ කන්නයේ මූලික අවස්ථා හානි වාර්තා වන විටම කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් | වගා හානි අයදුම්පත්‍ර නිවැරදිව සම්පූර්ණ කරවා ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ගොවීන්ට වන්දි ලබාගැනීමට හිමිකමක් නොමැති වුවද, වන්දි මුදල් ගෙවීම, වගා හානි තොරතුරු සටහන් කරනු ලබන බලයලත් නිලධාරී විසින් එම අවස්ථාවේදීම දින මුද්‍රාව තබා වන්දි අයදුම්පත් හානි වාර්තා කළ ගොවීන් වෙත නිකුත් කළ යුතු වුවත් දින මුද්‍රාව නොතබා නිකුත් කිරීම සහ අයදුම්පත්වල වන්දි ගණනය කිරීමේ (E කොටස) කොටස සම්පූර්ණ නොකර වන්දි ගෙවීම් සඳහා යොමුකිරීම් යන අඩුපාඩු නිරීක්ෂණය විය. | එම අයදුම්පත්‍රය ගොවීන් වෙත නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. “ඊ” කොටස වෙනුවට එහි ඇති සියලුම තොරතුරු මුද්‍රාවකට ගෙන අයදුම්පතෙහි මුල් පිටුවේ වම් කෙලවරේ මුද්‍රා තබා වන්දි ගණනය කිරීමේ කටයුතු සිදු කර ඇත. 2020 යල කන්නයේ සිට නිකුත් කළ අයදුම්පත්‍රවල “ඊ” කොටස මුද්‍රණය වී ඇති අතර “ඊ” කොටසේ සම්පූර්ණ කළ යුතු තොරතුරු වන්දි ගණනයේදී ඇතුළත් කර ඇත. මෙම කන්නයේ සිට ඉහත ගැටළුව නිරාකරණය වී ඇති බව වාර්තා කරමි. | |
| (ආ) කෘෂිකාර්මික තොරතුරු ඇතුළත් සම්පූර්ණ තොරතුරු පද්ධතියක් මණ්ඩලය සතුව වර්තමානය වන විටත් නොමැත. කෘෂිකාර්මික දත්ත ඇතුළත් මෘදුකාංගය හා ජංගම යෙදවුමක් ගොඩනැගීම සඳහා අමාත්‍යාංශය විසින් රු. මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 වනවිට මණ්ඩලය විසින් ඉහත යෙදවුම ගොඩනැංවීම සඳහා රු.මිලියන 5 ක් වැය කර යෙදවුම අර්ධ වශයෙන් නිර්මාණය කර තිබුණි. බලයලත් නිලධාරීන්ට පමණක් භාවිතා කළ හැකි මට්ටමින් නිර්මාණය කර ඇති මෙම යෙදවුම මඟින් ගම්පහ හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි කෘෂි වගාබිම් සිතියම් ගත කිරීම අර්ධ වශයෙන් අවසන් කර තිබුණ ද, සෙසු දිස්ත්‍රික් කාර්යාලවල අන්තර්ජාල පහසුකම් නොමැතිවීම තොරතුරු තාක්ෂණ උපකරණ නොමැතිවීම ආදී හේතූන් මත මෙතෙක් ක්‍රියාත්මක වී නොපැවතුණි. 2020/21 මහ කන්නයට අදාළව දැනුවත් කිරීමේ රැස්වීම් හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික්කවල පමණක් පවත්වා තිබුණි. එම නිසා ජාතික වැදගත්කමක් ඇති මෙම කාර්යභාරය අපේක්ෂිත මට්ටමින් භාවිතයේ නොමැතිබව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතීන් නවතා දැමීමක් සිදුවී නොමැති අතර, ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්ක වල සිදු කරන ලද මූලික ව්‍යාපෘතීන් (Feasibility Study) මගින් ලද අත්දැකීම් අනුව මෙම වැඩසටහන දීප ව්‍යාප්තව සිදුකිරීමට අදහස් කෙරේ. ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා මේ වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | කෘෂිකාර්මික දත්ත පද්ධතියක් ගොඩනැගිය යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර තිබූ නමුත් එහි ඇතුළත් විය යුතු වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධන වාර්තාව, ක්‍රියාකාරි සැලැස්ම මත පදනම් වූ කාර්යසාධන දර්ශක හා හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළව වාර්ෂික වාර්තා කෙටුම්පතට අදාළ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්වූ කාර්යසාධන දර්ශක හා හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු සපුරාගන්නා කාර්යසාධන වාර්තා වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීමට නියමිතය. | කෙටුම්පත් වාර්ෂික වාර්තාවට ගිණුම් ඉදිරිපත් කරන දිනට ඇතුළත් කළ හැකි සියලු තොරතුරු ඇතුළත් කළ යුතු වීම. |